**පාඨමාලා සංකේතය :** BUPH E3025

**වර්ගය :** C

**මාතෘකාව:** අභිධර්ම අධ්‍යයනය හා බටහිර දාර්ශනික චින්තා.

**අරමුණු හා අභිප්‍රේතාර්ථ :**

ථෙරවාදය ප්‍රමුඛ කොට නිකායාන්තරික අභිධර්මය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබාගැනීම හා බටහිර දර්ශනයේ ඉගැන්වෙන දාර්ශනික ප්‍රස්තුත බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් විමසා බැලීම මින් අපේක්ෂිතයි.

**ඉගෙනුම් ඵල :**

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් විද්‍යාර්ථියා ආදි බුදුසමය හා අභිධර්මය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබාගනිමින් බටහිර දාර්ශනික චින්තාවන්ට සාපේක්ෂව බෞද්ධ දාර්ශනික සංකල්ප ඇගයීමට පෙළඹෙයි.

**පාඨමාලා අන්තර්ගතය:**

අභිධර්මයේ ප්‍රභවයට බලපෑ පාලි සූත්‍රාගත ඉගැන්වීම්, ථෙරවාදී චිත්ත, චෛතසික, රූප විභාගයෙහි ඇති දාර්ශනික හා මනෝවිද්‍යාත්මක වටිනාකම, ථෙරවාද හා සර්වාස්තිවාද අභිධර්ම මූලග්‍රන්ථ, ආභිධර්මාගත ක්ෂණවාදය හා පරමාණුවාදය, ථෙරවාද හා සර්වාස්තිවාද ආභිධර්මික චින්තනයේ ඇති සම විෂමතා.බටහිර දර්ශනයේ මූලික ලක්ෂණ හා බුදුසමය, තත් දර්ශනාගත ආචාර විද්‍යාව හා බුදුසමය, බටහිර මනෝ විද්‍යාව හා බුදුසමය, ඥානය පිළිබඳ බටහිර නිර්වචනය හා බෞද්ධ ඉගැන්වීම්, බටහිර තර්ක ශාස්ත්‍රය හා බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය, අපරදිගසෞන්දර්යවාදී චින්තනය හා බුදුදහම. බුදුසමය පිළිබඳ අපරදිග ඇගයීම් හා සාවද්‍ය නිගමන.

**ක්‍රමවේදය :**

අත් පත්‍රිකා, අධ්‍යයන මාර්ගෝපදේශන හා සම්මන්ත්‍රණ.

**ඇගයීම් ක්‍රමය:**

වර්ෂාවසානයේදී පැවැත්වෙන පැය 03ක ලිඛිත පරීක්ෂණය, අධ්‍යයන සම්භාර 05 කි. ලකුණු සියයකි.

**නිර්දේශිත කියවීම්:**


තිලකරත්න, අසංග. (1995). *අභිධර්ම අධ්‍යයන.* කොළඹ: කරුණාරත්න සහ පුත්‍රයෝ

චන්ද්‍රවිමල හිමි, රේරුකානේ. (1987). *අභිධර්ම මාර්ගය.* බොරලැස්ගමුව: ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

ඥාණසීහ හිමි, හේන්පිටගෙදර. (1960). *අභිධර්ම පරීක්ෂණය.* ඇකිරියගල.

සාසනරතන හිමි, මොරටුවේ. (1976). *අභිධර්ම කෝෂය.* පානදුර.

ශ්‍රී ධර්මවංශ හිමි, මාතර. (1982). *අභිධර්ම චන්ද්‍රිකාව.*කොළඹ: තරුණ බෞද්ධ සංගමය.

ද සිල්වා, පද්මසිරි. (1963). *දාර්ශනික ගැටලු.*කැලණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය.

ධර්මසිරි, ගුණපාල. (1970). *දාර්ශනික ප්‍රශ්න.*කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වීරරත්න, ඩබ්ලිව්, ජී. *බෞද්ධ දේව සංකල්පය.*මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන.

Dharmasiri, G. (1974).*Buddhist Critique of Christian Concept of God*. Colombo.

Joshi, L.N. (1970). Brahamanism, *Buddhism and Hinduism*. Kandy.

Nyanatiloka, Ven. (1949).*Guide Through the Abhidhamma Pitaka.* Colombo.

Sumanapala, G.D. (1988). *Theravada Abhidharma*. Buddhist Research Society, Singapore.